**පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 18 - 2022**

**-----------------------------------------------------------------------**

## 1. විගණන මතය

1.1 පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 18 හි 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 2023 ජුනි 15 දින වන විට 2022 වර්ෂයට අදාලව පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 18 කට අදාලව විගණන වාර්තා නිකුත් කර තිබූ අතර එම වාර්තාවල තත්ත්වාගණනය කළ විගණන මතයක් ප්‍රකාශ කර තිබුණි. තත්ත්වාගණනය කළ විගණන මතයක් ප්‍රකාශ කිරීම සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන

### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන බැංකුව ගොවිජන සේවා කාරක සභාවේ ඒකකයක් බැවින් ගොවිජන බැංකුවට අදාළ සියළුම ගිණුම් ගොවිජන කාරක සභාවේ වාර්ෂික අවසන් ගිණුම්වලට ඇතුළත් කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 18ම එසේ කටයුතු කර නොතිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2012 පෙබරවාරි 29 දිනැති අංක 4/2012 දරන චක්‍රලේඛයේ 5.6(i) ප්‍රකාරව කටයුතු කළයුතුය. |

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------- | --------------------- | ------------- |
| (අ) | ගොවිජන සේවා කාරක සභා 18 හි ගොඩ ඉඩම් අක්කර 23 ක, පැරණි හා නව ගබඩා 12ක, කාර්යාලීය ගොඩනැගිලි 10 ක, නිල නිවාස 5 ක, පටක රෝපණාගාරයක හා ළිඳක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. කාරකසභා 18 න් 12ක ඉඩම් මේ වනතුරු ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට පැවරීම සිදුකර නොමැති බැවින් වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට නොහැකි ව ඇත. එම ඉඩම් පවරාගැනීමට කටයුතු කරමින් පවතින බව කාරුණිකව දැනුම් දෙමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව කටයුතු කළයුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 03 ක දේශගුණ සුහුරු වාරි ව්‍යාපෘතිය යටතේ 2022 වර්ෂයේ දී ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත ලැබී තිබූ වල් නෙළීමේ යන්ත්‍ර 08 ක, ගොයම් පැළ සිටුවන යන්ත්‍ර 09 ක, බීජ වී සිටුවීමේ යන්ත්‍ර 04 ක, රූපවාහිනියක හා ලැප්ටොප් පරිගණක දෙකක වටිනාකම් සහ ගොවිජන සේවා කාරක සභා 02 කට ලැබී තිබුණු පරිගණක යන්ත්‍ර 02 ක, ප්ලාස්ටික් පුටු 72 ක, සේප්පු 02ක, වතුර ෆිල්ටරයක සහ වෙබ් කැමරා 02ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වේ.මෙම උපකරණ තොගය CSIAP ව්‍යාපෘතිය මගින් ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත ලබාදී ඇත.එම ව්‍යාපෘති කාර්යාලය වෙතින් වටිනාකම් ලබාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව කටයුතු කළ යුතුය. |

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| **විගණන නිරීක්ෂණ** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| --------------------- | -------------------------- | ----------- |
| ගොවිජන කාරක සභා 10 ක ගිණුම් විෂයයන් 25 කට අදාළව මූල්‍ය ප්‍රකාශන හා අනුරූපී වාර්තා අතර ශේෂයෙහි එකතුව රු.71,684,553 ක නොසැසඳීම් පැවතුණි. | එකඟ වේ. ඉදිරි වසරේ ගිණුම් වාර්තා සැකසීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම් නොසැසඳීම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.3.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගොවිජන සේවා කාරක සභා 06 ක රු.89,495,858ක වටිනාකමැති ජර්නල් සටහන් 137 ක් සඳහා විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | එකඟ වේ. මින් ඉදිරියට විධිමත් අනුමැතියක් සහිතව ජ'නල් සටහන් පවත්වා ගැනීමට සියළු කමිටුවලට උපදෙස් ලබාදෙන බව කාරුණිකව දැනුම් දෙමි. | විධිමත් අනුමැතියක් සහිතව ජ'නල් සටහන් ඉදිරිපත් කල යුතුය. |

### 1.3.5 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සටහන්, තක්සේරු වාර්තා, ශේෂ සනාථන සහතික, ණය ලේඛන, ස්ථාවර වත්කම් ලේඛන, හිමිකම් සහතික සහ ණයහිමි කාල විශ්ලේෂණය වැනි සාක්ෂි නොමැති වීම හේතුවෙන් ගොවිජන සේවා කාරක සභා 18 හි රු.122,220,794 ක් වටිනා ගිණුම් විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | එකඟ වේ. සවිස්තරාත්මක සටහන්, තක්සේරු වාර්තා, ශේෂ සනාථන සහතික, ණය ලේඛන, ස්ථාවර වත්කම් ලේඛන, හිමිකම් සහතික නිවැරදි හා නිරවුල් කිරීමට කටයුතු කරමි. | වත්කම් සහ වගකීම් ශේෂ තහවුරු කර ගැනීමට අදාළ සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත | | | |
| (i) 22 වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 17ක කෘෂිකාර්මික ප්‍රතිපත්තිවලට අනුකූලව ප්‍රදේශයේ කෘෂිකාර්මික ඉඩම්වලට වඩා සුදුසු වන බෝග හා ඇති කලහැකි සතුන් කවරේදැයි නිශ්චය කර පිළිගත හැකි වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළයුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි. | එකඟ වේ. ඉදිරි වර්ෂයේ සිට 22 වගන්තිය අනුව කටයුතු කරමි. | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත ප්‍රකාරව කටයුතු සිදුකල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | 52 වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 18 හි සෑම කන්නයකටම පෙරාතුව ගොවිජන කාරක සභා බලප්‍රදේශය සඳහා කෘෂිකාර්මික වැඩසටහනක් පිළියෙල කළයුතු වුවත්, කාරක සභාව ඒ අනුව කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. ඉදිරි කන්නයේ කෘෂිකාර්මික වැඩසටහනක් පිළියෙල කිරීමට කටයුතු කරමි. | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කල යුතුවේ. |
| (iii) | 53(4) වගන්තිය | සෑම වසර 03 කට වරක්ම කෘෂිකාර්මික ඉඩම් නාම ලේඛන ප්‍රතිශෝධනය කළ යුතු වුවත්, කාරක සභා 08 ක් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාලගේ උපදෙස් පරිදි කටයුතුකරන බව කාරුණිකව දැනුම් දෙමි. | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>------------------------- | | | |
| | මුදල් රෙගුලාසි 880 හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ II කොටසේ 09 වගන්තිය | මුදලින් හෝ තොග සම්බන්ධයෙන් කටයුතු කිරීමට බලය දී ඇති සියලුම සේවකයින් ඇප තැබිය යුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 18 හි කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් ඇප තබා නොතිබුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අංක 7/2/15/3/3 (vii) හා 2023.01.23 දිනැති ලිපිය අනුව කෘ.ප.නි.ස.නිලධාරීන් ඇප මුදල් තැන්පත් කිරීමෙන් නිදහස් කර ඇත. | මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව සහ අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ<br>------------------------- | | | |
| (i) | 1994 මාර්තු 16 දිනැති අංක 392/94 දරන චක්‍රලේඛය | ගොවිජන කමිටුවට වෙනත් ආයතනවලින් හෝ පුද්ගලයින්ගෙන් අයවිය යුතු මුදල් නොපමාව අයකර ගතයුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 09 ක වසර කිහිපයක සිට පැවත එන රු.5,671,637 ක ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. මේ වන විට ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අංක 7/8/12/11 හා 2022.06.01 දිනැති අයවියයුතු හා ගෙවියයුතු ශේෂ නිරවුල් කිරීම යන ලිපියට අදාළව නිරවුල් කිරීමේ හැකියාව ඇති ශේෂ විශාල ප්‍රමාණයක් නිරවුල් කර ඇති අතර නිරවුල් කිරීමට | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අයකර ගතයුතු මුදල් නොපමාව අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | නොහැකි ශේෂයන් කොමසාරිස් ජනරාල් වෙත යොමුකර ඇති බව කාරුණිකව දැනුම් දෙමි. | |
| (ii) | 2013 මාර්තු 08 දිනැති 04/2013 චක්‍රලේඛය | ගොවිජන සේවා මධ්‍යස්ථාන පරිශ්‍රය උපයෝගී කර ගනිමින් ගොවි නිෂ්පාදන අලෙවිය, තාවකාලික ආපනශාලා පැවැත්වීම, ගොවි සංවිධානවල නිෂ්පාදන අලෙවිකිරීම වැනි කටයුතු කරන ලෙස උපදෙස් දී තිබුණද, ගොවිජන සේවා කාරක සභා 12 ක් විසින් එසේ කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. ඉදිරියේදී ඒ සම්බන්ධව කටයුතු කරමි. | 2013 මාර්තු 08 දිනැති 04/2013 චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2022 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 18 හි එකතුව රු.10,006,805 ක අතිරික්තයක්ද, ගොවිජන බැංකු 18 හි එකතුව රු.10,807,301 ක අතිරික්තයක්ද විය. 2021 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 18 හි එකතුව රු.6,584,393 ක අතිරික්තයක්ද ගොවිජන බැංකු 18 හි එකතුව රු.8,668,103 ක අතිරික්තයක්ද විය.

#### 2.1.1 විශ්ලේෂණාත්මක සමාලෝචනය

i. සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 16 ක රු.10,311,610 ක අතිරික්තයක් ලබා ගෙන තිබූ අතර ඊට සාපේක්ෂව පෙර වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 18 හිම අතිරික්තය රු.6,584,393 ක් විය. ඒ අනුව රු.3,727,217 ක අතිරික්තයේ වැඩිවීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේ කාරක සභා 02 ක ඌනතාවය රු.304,805 ක් වූ අතර ඊට සාපේක්ෂව පෙර වර්ෂයේ කිසිදු කාරක සභාවක ඌනතාවයක් නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ කාරක සභා 02 ක ඌනතාවය අතිරික්තයේ වැඩිවීම සමඟ ගැලපීමෙන් සමස්ථ අතිරික්තය රු.3,422,412 කින් වැඩි වී තිබුණි.

ii. ගොවිජන සේවා කාරක සභාවල මූලික කාර්යභාරයක් ලෙස පොහොර, කෘෂි රසායන ද්‍රව්‍ය, බීජ හා පැල, කෘෂි උපකරණ ඇතුළු කෘෂිකාර්මික භාණ්ඩ අලෙවි කිරීම වන අතර සමාලෝචිත වර්ෂයට අදාලව ගොවිජන සේවා කාරක සභා 18 ක එකතු මුළු අලෙවි වටිනාකම රු.391,152,864 ක් විය. මුළු එකතු දළ ලාභය රු.8,335,539 ක් වූ හෙයින්, ඒ අනුව එක් ගොවිජන සේවා කාරක සභාවක වාර්ෂික අලෙවි වටිනාකම සාමාන්‍ය රු.21,730,715 ක් වූ අතර සාමාන්‍ය දළ ලාභය රු.463,086 ක් විය.

iii. ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා කාරක සභා 18 හි මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| සමුච්චිත අරමුදල්වල වටිනාකම (ශුද්ධ වත්කම්) | = | 123,118,886 |
| දිගුකාලීන ණය වටිනාකම | = | 19,696,873 |
| ජංගම බැරකම් | = | 411,190,785 |
| මුළු වත්කම් | | |
| • ජංගම වත්කම් | = | 473,003,832 |
| • ජංගම නොවන වත්කම් | = | 81,002,712 |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 තැන්පත් ගිණුම් පිළිබඳ තොරතුරු සහ ඵලදායී ආයෝජනයක යොදවා නොතිබීම.**

2022 දෙසැම්බර් 31 දිනට ගොවිජන සේවා කාරක සභා 18 ක් හා ගොවිජන බැංකු 18 ක් විසින් රජයේ වානිජ බැංකු 02 හි පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම්වල පැවැති ශේෂයන් හා රජයේ බැංකුවල ඉතුරුම් හා ස්ථාවර තැන්පතු ලෙස සිදු කර ඇති ආයෝජනයන් පිළිබඳව තොරතුරු පහත දැක්වේ.

| | ඉතුරුම් තැන්පතු | ස්ථාවර තැන්පතු | ජංගම ගිණුම | එකතුව |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| කාරක සභා | 196,638,019 | 43,228,512 | 185,835,640 | 425,702,171 |
| ගොවිජන බැංකු | 22,535,792 | 7,706,181 | 1,836,509 | 32,078,482 |
| එකතුව | 219,173,811 | 50,934,693 | 187,672,149 | |

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කිසිදු පොලී ආදායමක් නොලබන ජංගම ගිණුම්වල පැවති ශේෂ රු.187,672,149 කි. එයින් ගොවිජන සේවා කාරක සභාවල ජංගම ගිණුමේ පැවති ශේෂය රු.185,835,640 ක් සහ ගොවිජන බැංකු ජංගම ගිණුම් ශේෂය රු.1,836,509 ක් වූ අතර ගොවිජන සේවා කාරක සභා 08 ක ජංගම ගිණුමේ පැවති ශේෂය රු.2,000,000 ඉක්මවා තිබුණි. | එකඟ වේ. උක්ත ගිණුම් පවත්වාගෙන යන බැංකු කළමණාකරණය සමඟ සාකච්ඡාකර ජංගම ගිණුමේ අවම ශේෂයක් පවත්වා ගැනීම සහ උක්ත ගිණුම් ස්ථාවර නියෝග අනුව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. | අරමුදල් වඩාත් ඵලදායී ආයෝජන මාර්ගයක යෙදවිය යුතුය. |
| (ආ) අඩු පොලී ආදායමක් ලැබෙන ඉතුරුම් තැන්පතුවල ආයෝජනය කර ඇති මුදල් එකතුව රු.219,173,811 කි. ඒ අනුව මුදල් ඵලදායී ලෙස යොදවා නොතිබුණි. | එකඟ වේ. එම වර්ෂයේ පොහොර මිළ ගණන් අසීමිත ලෙස වැඩිවීම හේතුවෙන් හා | අරමුදල් වඩාත් ඵලදායී ආයෝජන මාර්ගයක යෙදවිය යුතුය. |

| | | |
|---|---|---|
| | පොහොර අත්පිට මුදලට ගැනිමට සිදුවීම හේතුවෙන් කම්ටුවේ ඉතිරිකිරීමේ ගිණුමේ වැඩි මුදලක් රඳවා ගැනීමට සිදුවී ඇති බව කාරුණිකව දැනුම් දෙමි. මේ වන විට පොහොර මිළ ගණන් අඩුවීම හේතුවෙන් ගො.සෙ. කාරක සභා කිහිපයක් වැඩිපුර පැවති මුදල් ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර ඇත. | |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුන්නේශ්වරම ගොවිජන සේවා කාරක සභාවේ බ/මුංගන්දළුව කොට්ඨාශයේ ඉඩම් වෙන්දේසි සමාගමක් විසින් කැබලි කර විකුණනු ලබන ඉඩමට අයත් අක්කර එකක පමණ විශාල වූ කුඹුරේ පස් ඉවත් කර අනවසර ඇළ මාර්ගයක් සකස් කිරීම හා ඉවත් කරන ලද පස් කුඹුරු ලියැදිවලට දමා කුඹුරු ලියැදි පස්වලින් පිරවීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු ආරම්භ කර ඒ සම්බන්ධ තොරතුරු රැස්කර තිබුණ ද, නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. නඩු පැවරීමට කටයුතු කරමින් පවතින බව කාරුණිකව දැනුම් දෙමි. | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) ගොවිජන සේවා කාරක සභා 06 කට අදාලව ගෙවිය යුතු රු.6,039,149 ක ණයහිමි ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. මේ වන විට ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අංක 7/8/12/11 හා 2022.06.01 දිනැති අයවියයුතු හා ගෙවියයුතු ශේෂ නිරවුල් කිරීම යන ලිපියට අදාළව නිරවුල් කිරීමේ හැකියාව ඇති ශේෂ විශාල ප්‍රමාණයක් නිරවුල් කර ඇති අතර නිරවුල් කිරීමට නොහැකි ශේෂයන් | ගෙවිය යුතු ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කොමසාරිස් ජනරාල් වෙත යොමුකර ඇති බව කාරුණිකව දැනුම් දෙමි. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය ආරම්භක දිනට වී වගා කල හැකි (A ශ්‍රේණිය), වෙනත් භෝග වගා කල හැකි (B ශ්‍රේණිය) හා වගා කල නොහැකි (C ශ්‍රේණිය) පුරන් කුඹුරු පිළිවෙළින් අක්කර 344, 882 හා 960 ක් වූ අතර වර්ෂය තුල වගා කිරීම් සඳහා එකතු කර ගැනීමෙන් අනතුරුව සමාලෝචිත වර්ෂය අවසාන දිනට වී වගා කල හැකි, වෙනත් භෝග වගා කල හැකි හා වගා කල නොහැකි අක්කර 330, 877 හා 960ක් පැවතුණි. | එකඟ වේ. පුරන් කුඹුරු අස්වැද්දීම යටතේ ඉදිරියට ද වගාකිරීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි. | පුරන් කුඹුරු වාර්ෂිකව වගාවන් සඳහා භාවිතයට ගන්නා ප්‍රමාණය වැඩි කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | මාදම්පේ ගොවිජන සේවා කාරක සභාවේ 2009 වර්ෂයේදී අලෙවි අංශයේ සේවයේ නියුතුව සිටි අලෙවි සේවිකාවක විසින් සිදු කර තිබූ රු.2,110,289 ක මූල්‍ය අක්‍රමිකතාවය සමාලෝචිත වර්ෂය වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. නඩුව විභාග වෙමින් පවතින බව කාරුණිකව දැනුම් දෙමි. | මූල්‍ය අක්‍රමිකතාවයට අදාළ මුදල් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022/23 මහ කන්නය සඳහා ගොවිජන සේවා මධ්‍යස්ථාන 18ම සඳහා කාබනික ඝන පොහොර, කාබනික දියර හා ජෛව දියර පොහොර පිළිවෙළින් මෙට්‍රික් ටොන් 2,924.84, ලීටර 47,105.60 හා ලීටර 74,455 ක් ලබා ගෙන තිබුණි. මේ සඳහා 2023 ජනවාරි 31 දිනට ගෙවිය යුතු මුදල වූ රු.332,379,603 න් රු.140,551,870 ක් ගෙවා තිබුණි. පරිසර හිතකාමී කාබනික පොහොර බෙදා දීමේ වැඩසටහනේ නිරත පාර්ශවයන්ට අදාළ උපදෙස් මාලාවේ 5.5.2.1 හා 5.5.2.2 අනුව ඉහළ ප්‍රමිතියෙන් යුතු පොහොර ගොවීන්ට ලැබෙන බවට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වගබලා ගත යුතු නමුත් ගොවිජන සේවා මධ්‍යස්ථාන 07 ක නිෂ්පාදකයින් අතින් ලැබෙන පොහොර නියමිත පොහොර අනුකූලතා සහතිකය ලබා ඇති බවට ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරින් හා බෙදා හරින අවස්ථාවේදී කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන් දැනගත යුතු වුවත් අනුකූලතා සහතිකයේ තොරතුරු සමඟ පොහොර තොග පරික්ෂා කිරීමෙන් තොරව පොහොර තොග ලබා ගෙන තිබුණි. | කාබනික පොහොර නිෂ්පාදකයන් ලියා පදිංචි කිරීම, ප්‍රමිතිය පරීක්ෂා කිරීම පොහොර ලේකම් කාර්යාලය මගින් සිදුකරන ලද අතර එකී සමාගම් විසින් ලබාදෙන පොහොර ප්‍රමිතියෙන් යුක්ත බවට අනුකූලතා සහතිකය ගොවිජන සේවා කමිටුවලට ලබාදීමෙන් පසු අදාල ගොවිජන සේවා කමිටු මගින් පොහොර බෙදාහැරීමේ කටයුතු සිදුකරන ලද බව කාරුණිකව දැනුම් දෙමි. | නිසි ප්‍රමිතියෙන් හා අදාළ පිරිවිතරයන්ට අනුකූලව අදාළ සැපයුම් සිදු කර ඇති බවට සහතිකයක් ලබා ගැනීමෙන් පසුව පමණක් ගොවීන් වෙත නිකුත් කිරීම සඳහා නිර්දේශ කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 වර්ෂයේදී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන්, දිස්ත්‍රික් කාර්යාලයට ලද පාංශු පරීක්ෂණ කට්ටල හා පරීක්ෂණ දියර ගොවිජන සේවා මධ්‍යස්ථාන 17 කට PH අගය හා විද්‍යුත් සන්නායකතාවය පරීක්ෂා කිරීම සඳහා ලබාදී තිබුණද ඒවායෙහි වටිනාකම දිස්ත්‍රික් කාර්යාලය සතුව නොතිබුණු අතර එම පරීක්ෂණ කට්ටල සහ පරීක්ෂණයන්ට අදාළ දියර මේ දක්වා නිෂ්කාර්යව පවතින අතර පරීක්ෂණ දියර සියල්ලද කල් ඉකුත් වී තිබුණි. තවද, 2019 වර්ෂයේදී දිස්ත්‍රික් කාර්යාලය විසින් රු.405,324 ක් වටිනා පරීක්ෂණ දියර ප්‍රමාණයක් මිලදී ගෙන තිබුණු අතර මේ වන විට ඒවාද කල් ඉකුත් වී තිබුණි. | මෙම පරීක්ෂණ කට්ටලය මගින් පරීක්ෂාකල හැක්කේ Ph හා Ec අගය පමණි. නමුත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පිහිටුවා ඇති පස් පරීක්ෂණ මධ්‍යස්ථාන මගින් පස් සාම්පලයේ පරීක්ෂණ ගණනාවක් සිදුකල හැකිවීම හා විධිමත් සහතිකයක් නිකුත් කිරීම හේතුවෙන් ගොවිජන මධ්‍යස්ථාන මගින් පස් පරීක්ෂණ කිරීම සඳහා යොමුවීම ඉතා අඩු මට්ටමක පවතින බව කාරුණිකව දැනුම් දෙමි. | පාංශු පරීක්ෂණ කට්ටලය හා පරීක්ෂණ දියර ඵලදායීව උපයෝජනයට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | නයිනමඩම ගොවිජන සේවා කාරක සභාවේ 2021 නොවැම්බර් මස වී ගොවීන්ට නොමිලේ බෙදා දීමට ලැබුණු 2021 සැප්තැම්බර් නිෂ්පාදිත කිලෝ ග්‍රෑම් 800 ක KCL පොහොර තොගයෙන් 2023 අප්‍රේල් මස වනවිට රු.200,400 ක් වූ පොහොර කිලෝ ග්‍රෑම් 417.5 ක් හා 2020 ඔක්තෝබර් මස නොමිලේ බෙදා දීමට ලැබුණු කිලෝ ග්‍රෑම් 800 ක MOP පොහොර තොගයෙන් කිලෝ ග්‍රෑම් 429.5 ක පොහොර තොගය ගොවීන්ට නිකුත් කර නොතිබුණි. | එකඟ වේ. මෙම පොහොර තොගයෙන් KCL පොහොර කිලෝ ග්‍රෑම් 417.5 ගොවීන් වෙත ලබාදීමට උපදෙස් ලබාදී නොමැති අතර MOP මිටියක් රු 15,000 බැගින් විකිණීමට අවසර ලබාදී ඇත. උපදෙස් පරිදි කටයුතු කරමි. | පොහොර බෙදා හැරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව සහ විධිමත්ව සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | මහකුඹුක්කඩවල ගොවිජන සේවා කාරක සභාව වෙත 2021 ජුනි 23 ලංකා පොහොර සමාගමෙන් ගොවීන් වෙත නොමිලේ බෙදාදීම සඳහා ලැබී තිබූ ටීඑස්පී පොහොර කිලෝග්‍රෑම් 3,600 ක තොගයෙන් කිලෝග්‍රෑම් 3,078 ක් ද, පෞද්ගලික ආයතනයක් වෙතින් ගොවීන් වෙත නොමිලේ බෙදාදීම සඳහා ලැබී තිබූ ජෛව දියර පොහොර ලීටර් 266 ක් සහ ආණමඩුව ගොවිජන සේවා කාරක සභාව වෙත 2022 මැයි 24 දින එප්පාවෙල පොස්පේට් සමාගමෙන් ලැබී තිබූ ERP සහනාධාර පොහොර මිටි 1,200 කින් පොහොර මිටි 168 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත්, ගොවීන් වෙත බෙදා හැරීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. මෙම කාරක සභා දෙකෙහිම පොහොර තොගයන් නොමිලේ ලබාදීම සඳහා නිකුත්කර ඇති අතර එම ශේෂයන් අදාළ කන්නයේ ගොවීන් වෙත පොහොර ලබාදීමෙන් පසුව ඉතිරිව පැවති අතර නැවත ලබාදීම සම්බන්ධයෙන් උපදෙස් ලබානොදීම හේතුවෙන් ගබඩාවල ඉතිරිව පවතින බව කාරුණිකව දැනුම් දෙමි. | අදාළ පොහොර තොග කල් ඉකුත් වීමට පෙර ගොවීන්ට නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 06 ක් විසින් ගොවිජන සේවා කොමසාරිස් වෙත ට්‍රැක්ටර් වාරික ලෙස ගෙවිය යුතු රු.6,445,224 ක ණය මුදලක් දීර්ඝ කාලයක සිට පැවත එන නමුත් එවැනි ට්‍රැක්ටර් රථ ගොවිජන සේවා කාරක සභාවල භෞතිකව නොතිබුණි. | එකඟ වේ. මෙම දිස්ත්‍රික්කයේ යන්ත්‍රෝපකරණ (ට්‍රැක්ටර්) 2022 හා 2023 වර්ෂවල ලංකා සීනි සමාගමට හා ජාතික කඩදාසි සංස්ථාවට භාරදෙන ලදී. තවත් කොටසක් වෙන්දේසිකර ඇති අතර ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත්කර නිරවුල් කිරීමට කටයුතු කරමි. | ට්‍රැක්ටර් රථයේ භෞතික පැවැත්ම පිළිබඳව සොයා බලා ණය මුදල නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

**3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 07 ක ට්‍රැක්ටර් රථ 08 ක් ද, කාරක සභා 03 ක පැළකුටි 05 ක් ද, කාරක සභා 07 ක නිල නිවාස 07 ක් ද, කාරක සභා 06 ක පාංශු පරීක්ෂණාගාර 06 ක් ද, එක් කාරක සභාවක ගබඩාවක් ද, කාරක සභා 02 ක බිම් තරාදි 02 ක් ද, කාරක සභා 03 ක ගොයම් කපන යන්ත්‍ර 04 ක් ද කාරක සභා 08 ක කම්තු භූමිද, කාරක සභාවක වතුර මෝටරයක් හා නළ ළිඳක් ද නිෂ්කාර්යව පැවතුණි. | එකඟ වේ. ඉදිරි වර්ෂයේ කාර්යක්ෂම භාවිතයට හා/හෝ භාවිතයෙන් ඉවත්කල හැකි නිෂ්කාර්ය වත්කම් නිසි අනුමැතිය යටතේ ඉවත්කිරීමට කටයුතු කරමි. | නිෂ්කාර්ය සම්පත් උපයෝජනය සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වනාතවිල්ලුව ගොවිජන සේවා කාරක සභාවේ 2012 වර්ෂයේ දී ගොවිජන සංවර්ධන කම්තු භූමියේ ස්ථාපිත කර තිබුණු පටක රෝපනාගාරයේ නිෂ්පාදන කටයුතු, සමාලෝචිත වර්ෂය වනවිට අකාර්යක්ෂම තත්ත්වයේ පැවතුණු අතර, ඉන් ලැබෙන ආදායම අභිබවා කම්තුව දැරූ වියදම වාර්ෂිකව අඛණ්ඩව ඉහළ යමින් පැවතුණි. 2022 දෙසැම්බර් 31 දින වනවිට කම්තුව දරා ඇති සමාලෝචිත | එකඟ වේ. ඉදිරියේ දි උක්ත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් විශේෂ විමර්ශනයක් සිදුකර එය තවදුරටත් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් | පටක රෝපනාගාරය උපයෝජනයට ගැනීමට විධිමත් සැලැස්මක් සකස් කර එය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| වර්ෂයේ වියදම රු.219,710 ක් ද ඇතුළුව සමස්ථ වියදම රු.2,394,908 ක් වී තිබූ අතර, එය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ලැබිය යුතු ශේෂයක් ලෙස අනාවරණය කර තිබුණි. ඒ අනුව කම්ටු අරමුදල්, කම්ටුවේ ප්‍රධාන මෙහෙයුම් කටයුතු වෙනුවෙන් වැය කිරීමට තිබූ හැකියාව අහිමි වී ගොස් තිබුණි. | තීරණයක් ගන්නා බව කාරුණිකව දන්වමි. |

## 3.6 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුත්තලම ගොවිජන සේවා කාරක සභාවේ 2022 වර්ෂයේ අමුණු 04 කට අදාළව ප්‍රතිසංස්කරණ විෂයයන් 36 ක්ද, කෘෂිමාර්ග ප්‍රතිසංස්කරණ විෂයයන් 37 ක්ද, කෘෂි ළිං ප්‍රතිසංස්කරණ 13 ක්ද, කෘෂි ළිං අලුතින් ඉදි කිරීම් 05 ක්ද, ඉදි කිරීමට සැලසුම් කර තිබුණ ව්‍යාපෘතිද ඇස්තමේන්තු එකතුව රු.5,600,000 ක් වූ වැව් 10 ක් ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර තිබුණද එම කටයුතුද 2023 මැයි 23 දින දක්වාත් ඉටු වී නොතිබුණි. | එකඟ වේ. රටේ පැවති කොරෝනා වසංගත තත්ත්වය හා උද්ධමනය හේතුවෙන් සංවර්ධන කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් නොවූ අතර, 2023 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් වී ඇති බවත්, ඒවා ගිවිසුම් ප්‍රකාරව වැඩ ඇරඹීමට නියමිතය. | වාරිකර්මාන්ත හා වාරිමාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු හා ඉදි කිරීම් කටයුතු යාවත්කාලීනව සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.7 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.2 (අ) වගන්තියට අනුකූල නොවන පරිදි 2022 වසර තුළ දී මිලගණන් කැඳවීමකින් තොරව අවස්ථාවන් ගණනාවක දී ඉඟිණිමිටිය ගොවිජන කාරක සභාව විසින් රු.169,536 ක ලිපිද්‍රව්‍ය සහ පුත්තලම ගොවිජන සේවා කාරක සභාව විසින් රු.1,121,000 ක අලෙවි ද්‍රව්‍ය සහ ටෝනර් ඇතුළු ලිපි ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණි. | උක්ත අනාවරණය අනුව ඉදිරියේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය දැඩිව අනුගමනය කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

## 3.8 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 18 හි වර්ග අඩි 7988 ක් කාර්යාල ගොඩනැඟිලි පරිශ්‍ර සඳහා වෙනත් ආයතනවලට වාර්ෂිකව රු.1,111,759 ක් අයකර ලබාදී තිබුණු අතර, මාසික කුලිය දීර්ඝ කාලීනව සංශෝධනය කර නොතිබීම හේතුවෙන් ගොවිජන සේවා මධ්‍යස්ථානයට ලබා ගැනීමට තිබූ ආදායම් අහිමි වී ගොස් තිබුණි. | කොමසාරිස් ජනරාල් විසින් නිකුත්කරන ලද නව චක්‍රලේඛ අංක 9/2015 (සංශෝධන 1) හා 2023.08.23 දිනැති ලිපිය අනුව කටයුතු කරමි. | කාමර කුලිය යාවත්කාලීනව සංශෝධනය කිරීමට කටයුතු කල යුතුය. |

## 3.9 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 12 ක කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර තනතුරු 152ක් පුරප්පාඩුව පැවතීම හේතුවෙන් අදාල වසම් තුළ අක්කර බදු අය කිරීම් හා කෘෂිකාර්මික ව්‍යාපෘති හරියාකාරව ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. | එකඟ වේ. නිළධාරීන් ගේ හිඟය හේතුවෙන් මෙම තත්වය නිර්මාණය වී ඇත.මේ වන විට ඇතැම් නිළධාරීන්ට සිය රාජකාරී වසමට අමතරව තවත් වසම් දෙකක වැඩ ආවරණය කිරිමට සිදුව ඇත. | පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 3.8.2 වගන්තියේ විධිවිධාන අනුව තෘප්තිමත් සේවයකට ඉඩ සැලසීම සඳහා සුදුසු මාරු වීමේ ක්‍රමවේදයක් ඇති කල යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 18 හි අනුයුක්ත කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියක් යටතේ ස්ථාන මාරුවීම් සඳහා යටත් නොකිරීම නිසා එක ම සේවා ස්ථානයක දීර්ඝ කාලයක් සේවය කර තිබුණි. | ස්ථාන මාරු මේ වන විටද සිදුකරමින් පවතින අතර නිළධාරී හිඟය හේතුවෙන් ගැටලුකාරී තත්වයන් නිර්මාණය වී ඇති බව කාරුණිකව දැනුම් දෙමි. | සුදුසු ස්ථානමාරු ක්‍රමවේදයක් අනුගමනය කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාලව පිළියෙල කර තිබූ අයවැය ඇස්තමේන්තු අනුව ගොවිජන සේවා කාරක සභා 18 හි ආදායම් හා වියදම් විෂයයන් 141 ක් සඳහා සියයට 1.3 සිට සියයට 1123 ක පරාසයකින් විචලනයන් පැවතුණි. මේ හේතුවෙන් පාලන ක්‍රමවේදයක් ලෙස යොදා ගනු ලබන අයවැය ලේඛන පාලනය සඵලදායි පාලන උපක්‍රමයක් ලෙස යොදාගෙන නොතිබුණි. | පැවති වසන්ගත තත්වය හා ගොවි ජනතාව මුහුණ දෙමින් සිටින ආර්ථික අවපාතය හේතුකරගෙන නිසි පරිදි ආදායම් වියදම් ඇස්තමේන්තු සැකසීම හා ඒ අනුව කටයුතු කිරීම දුෂ්කර වූ අතර ඉදිරියේදී එවැනි විචලතාවයන් අවම කරගැනීමට අවධානය යොමුකරන බව කාරුණිකව දන්වමි. | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කල යුතුය. |

## 5. ගොවිජන බැංකු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ----------------------- | ----------- |
| (අ) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 3.4.11(i) ප්‍රකාරව වගා ණය ප්‍රදානයේ දී අයකරන ආපදා ණය ආවරණ වාරිකය මඟින් අරමුදලක් ගොඩනැඟිය යුතු අතර, එම අරමුදලට රැස්වන මුදල් රාජ්‍ය බැංකුවක වැඩි පොලියක් ලැබෙන ලෙස ආයෝජනය කලයුතු බව දක්වා ඇතත්, ගොවිජන බැංකු 02 ක රු.519,581 ක් වටිනා මුදල් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. කඩිනමින් කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි. | ආපදා ණය ආවරණ වාරික අරමුදල චක්‍රලේඛය ප්‍රකාරව ආයෝජනය කල යුතුය. |
| (ආ) | ගොවිජන බැංකුවක යම් අතිරික්තයක් තිබේ නම් හෝ මුදල් අනවශ්‍ය ලෙස රැඳී තිබෙන බව පැහැදිලි වේ නම් 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන චක්‍රලේඛයේ 4.4.4 වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතු වුවත් ඊට අනුකූල නොවන පරිදි සමාලෝචිත වර්ෂය අවසන් දිනට ගොවිජන බැංකු 11 ක සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුම්වල රු.21,140,502 ක ශේෂයක් පැවතුනි. | උක්ත අනාවරණයෙන් දක්වා ඇති ඉතිරිකිරීමේ ගිණුම් ශේෂයන් ගොවීන් සඳහා ණය ලෙස නිකුත්කලයුතු වටිනාකම් සලකාබලා ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | ගොවිජන සංවර්ධන කොමසාරිස්ගේ 2013 ජුනි 16 දිනැති අංක 07/12/04/05 දරන චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ගොවි බැංකු ලාභයෙන් සියයට 80 න් සියයට 30 ක් ගොවිජන සේවා කාරක සභා අරමුදලට බැරකල යුතු වුවත් ගොවිජන බැංකු 10ක් විසින් එසේ සිදුකර නොතිබුණි. | උක්ත අනාවරණයේ දක්වා ඇති චක්‍රලේඛනය අනුව කඩිනමින් කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි. | ගොවිජන සංවර්ධන කොමසාරිස්ගේ 2013 ජුනි 16 දිනැති අංක 07/12/04/05 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඈ) | 2012 පෙබරවාරි 29 දිනැති 4/2012 චක්‍රලේඛයට අනුව ණය නිරවුල් කිරීම හා නියමිත දිනට ඒවා අයකර ගැනීම ගොවිජන බැංකුවේ කාර්ය භාර්යයක් වුවද, සමාලෝචිත වර්ෂය අවසානයට ගොවිජන බැංකු 14 ක් විසින් රු.35,692,329 ක් වූ හිඟ ණය ශේෂ සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. | උක්ත අනාවරණය අනුව හිඟ ණය අයකර ගැනීමට හා ඒ සඳහා නීතිමය කටයුතු අනුගමනය කරන බව කාරුණිකව දන්වමි. | 2012 පෙබරවාරි 29 දිනැති 4/2012 චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව හිඟ ණය අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ගොවිජන බැංකු 11 ක් යටතේ සිතමු කාන්තා ගොවි සංවිධාන 595 ක් ලියාපදිංචි වී තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසානයේ දී ඉන් ගොවි සංවිධාන 281 ක්ද ගොවිජන බැංකු 07 ක් යටතේ පෙර මහ ළමා ඉතුරුම් තැන්පත් 1781 ක් ආරම්භ කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් 1291 ක්ද අක්‍රීය තත්ත්වයේ පැවතුණි. | උක්ත අනාවරණයේ දක්වා ඇති ශේෂයන් සක්‍රීය කිරීම සඳහා ඉදිරියේ දී කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි. | ගොවි සංවිධාන ශක්තිමත් කිරීමට හා ක්‍රියාකාරී මට්ටමින් පවත්වාගෙන යාමට ගොවි බැංකුව කටයුතු කළ යුතුය. |